# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2394/10 - 2024 ජූලි මස 22 වැනි සඳුදා - 2024.07.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත**

53 වන වගන්තිය යටතේ වූ නියමය

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ නිර්දේශ සැළකිල්ලට ගෙන සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව, මේ නියමය මඟින් -

(*අ*) අමාත්‍ය මණ්ඩලය විසින් 2024 ජූලි මස 09 වැනි දින අංක 24/1304/631/032 දරන තීරණය මඟින්, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති බලයලත් තැනැත්තාගේ ව්‍යාපාරය ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස නම් කිරීම අනුමත කර ඇති බවටත්;

(*ආ*) ඒ ව්‍යාපාරය ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස සැලකීමට හේතු මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි වන බවටත්;

(*ඇ*) පනත් යටතේ ප්‍රදානය කරන ලද නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු බවටත්; සහ

(*ඈ*) නිශ්චිතව දක්වා ඇති පනත් යටතේ ප්‍රදානය කරන ලද නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් මෙහි IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති දිනවලදී ආරම්භ විය යුතු බවට සහ ක්‍රියාත්මකවීම අවසන් විය යුතු බවටත්,

නිශ්චිතව දක්වමි.

රනිල් වික්‍රමසිංහ,
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2024 ජූලි මස 19 වැනි දින,
කොළඹ දී ය.


1A - PG 6776 — 289 (2024/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| **I වන උපලේඛනය**<br><br>**ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස නම් කර ඇති ව්‍යාපාරයේ විස්තර** | |
|---|---|
| 1. බලයලත් තැනැත්තාගේ නම | පගේරො ලංකා සොෆ්ට්වෙයාර් ඉංජිනියරිං (පීවීටී) එල්ටීඩී<br>(PAGERO LANKA SOFTWARE ENGINEERING (PVT) LTD) |
| 2. බලපත්‍ර අංකය | 2402220050 |
| 3. බලපත්‍රය නිකුත් කරන ලද දිනය | 2024 මාර්තු 28<br><br>බලපත්‍රය නිකුත් කරන ලද දින සිට මාස 6ක් ඇතුළත වූ දිනයක දී ව්‍යාපාරය ආරම්භ කළ යුතු ය.<br><br>(2022 අංක 01 දරන බලයලත් තැනැත්තන් ලියාපදිංචි කිරීමේ, බලපත්කරණ, බලය පැවරීමේ හා සෙසු අනුමැතීන් සඳහා වූ නියෝගවල 27 වැනි නියෝගයට අනුව) |
| 4. අක්වෙරළ සමාගම් ලියාපදිංචි කිරීමේ අංකය | PCC00296106 |
| 5. ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර වර්ගීකරණය | ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරය |
| 6. නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් සඳහා හිමිකම | PAGERO LANKA SOFTWARE ENGINEERING (PVT) LTD ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස පමණක් නම් කරනු ලැබ ඇති අතර, එය ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාරයක් ලෙස නම් කරනු ලැබීමට සුදුසුකම් නොලබයි |
| 7. සුදුසුකම් ලැබීමේ නිර්ණායක | 2023 අගෝස්තු මස 04 වැනි දින අංක 2343/60 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2023 අංක 2 දරන කොළඹ වරාය නගරය (ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ) නියෝගවල 4(2)(ඈ) සහ 4(3)(අ) සහ (ආ) වන නියෝගවල නිශ්චිතව දක්වා ඇති නිර්ණායක |
| 8. අදාළ වන නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් යෝජනා ක්‍රමය | 2023 අංක 2 දරන කොළඹ වරාය නගරය (ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ) නියෝගවල 5 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති යෝජනා ක්‍රමය |

## II වන උපලේඛනය

### ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස සැලකීමට හේතු

ව්‍යාපාර, ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාර ලෙස නම් කිරීමේ දී, 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53(5) වන වගන්තියේ දක්වා ඇති පරිදි, ජාතික යහපත සැලකිල්ලට ගනිමින් හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීම පිණිස කොළඹ වරාය නගරය ස්ථාපිත කිරීමේ සාර්ථකත්වය සහතික කිරීම සඳහා, එකී පනතේ 5 වන වගන්තියේ දක්වා ඇති කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ අරමුණු සැලකිල්ලට ගනු ලැබ ඇත.

PAGERO LANKA SOFTWARE ENGINEERING (PVT) LTD සමාගම, ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් වන අතර එය ස්වීඩනයේ සංස්ථාපිත සමාගමක් වන Pagero AB හෝ පූර්ණ හිමිකාරිත්වය සහිත අනුබද්ධිත සමාගමකි. එ.ජ.ඩො. මිලියන 50 කට අධික වාර්ෂික පිරිවැටුමක් සහිතව, Pagero AB සමාගම, ජාත්‍යන්තර වෙළඳපලවල් අතර ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන් සම්බන්ධ කරන්නා වූ, ගෝලීය වශයෙන් විශාලතම B2B (එක් ව්‍යාපාරයක් සහ තවත් ව්‍යාපාරයක් අතර පවතින ව්‍යාපාර) ජාලයන් අතරින් එකක් ලෙස මෙහෙයුම් කටයුතු සිදු කරයි. Pagero AB හි ක්‍රියාමාර්ගය මගින්, තම මෙහෙයුම් පහසුවෙන් කරගෙන යාම සඳහා ව්‍යාපාර සවිබල ගන්වමින්, නියෝග, කුවිතාන්සි සහ ගෙවීම් වැනි වැදගත් ලේඛන පහසුවෙන් සහ ආරක්ෂිතව ඩිජිටල් මාර්ගයකින් හුවමාරු කර ගැනීමට හැකියාව සලසයි. තවද, සම්ප්‍රදායික ලේඛන හුවමාරු කිරීමේ ක්‍රම ආශ්‍රිතව සිදුවන කඩදාසි භාවිතය සහ කාබන් විමෝචනය අවම කරමින් පාරිසරික වගකීම ප්‍රවර්ධනය කිරීමෙහි ලා Pagero සමාගම කැප වී ක්‍රියා කරයි.

කොළඹ වරාය නගරයේ අක්වෙරළ සමාගමක් ලෙස ලියාපදිංචි වී ඇති PAGERO LANKA SOFTWARE ENGINEERING (PVT) LTD සමාගම, ගෝලීය හවුල්කරුවන් සඳහා ඉලෙක්ට්‍රොනික ලේඛන/ ඉලෙක්ට්‍රොනික කුවිතාන්සි ලබාදීමේ විසඳුම් සම්බන්ධයෙන් නවෝත්පාදනයන් සිදු කිරීමට පොළඹවන්නා වූ, Pagero AB සමාගම සඳහා වන පුළුල් පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයක් බවට පත් කිරීමට නියමිත ය. PAGERO LANKA SOFTWARE ENGINEERING (PVT) LTD සමාගම විසින් කොළඹ වරාය නගරය තුළ සිය මෙහෙයුම් ආරම්භ කිරීමෙන් පළමු වසර දෙක තුළ දී පුහුණු මෘදුකාංග ඉංජිනේරුවරයන් ආසන්න වශයෙන් 100 දෙනෙකු සේවයට බඳවා ගනු ලබන අතර, දෙවන වසරේ දී තවත් පුද්ගලයන් 50 දෙනෙකු සේවයේ යොදවනු ඇත.එ.ජ.ඩො. 100,000ක යෝජිත ආයෝජනයක් සමඟ, ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට දායකත්වය ලබාදීම වෙනුවෙන් ඔවුන් තුළ ඇති කැපවීම ප්‍රදර්ශනය කරමින්, පසුව එළඹෙන වර්ෂවලදී සේවකයන්ගේ පාරිතෝෂික හරහා ආසන්න වශයෙන් එ.ජ.ඩො. මිලියන 2ක් උපයනු ඇති බවට ව්‍යාපාර පුළුල් කිරීමේ සැලසුම් මඟින් පුරෝකථනය කරයි.

| **III වන උපලේඛනය**<br><br>**පනත් යටතේ ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම්** | |
|---|---|
| *පනතේ II වන උපලේඛනයේ ලැයිස්තුගත පනත්* | *ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම්* |
| 1. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත | (*අ*) සියලු ආදායම්, ලාභ සහ බෙදාදෙනු ලබන ලාභාංශ මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලුම බදුවලින් නිදහස් කරනු ලැබිය යුතු ය;<br><br>(*ආ*) කරනු ලබන සියලුම ගෙවීම් මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති රඳවා ගැනීමේ බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය; |
| 2. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ හා සේවා ආනයන සහ දේශීය මිලදී ගැනීම් මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති බදුවලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 3. 2002 අංක 11 දරන මුදල් පනත | මේ පනතේ සියලු විධිවිධානවලින් නිදහස් වන්නේ ය. |
| 4. 2005 අංක 5 දරන මුදල් පනත | මේ පනතේ සියලු විධිවිධානවලින් නිදහස් වන්නේ ය. |
| 5. 1989 අංක 13 දරන සුරාබදු (විශේෂ විධිවිධාන) පනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ ආනයන සහ දේශීය මිලදී ගැනීම් මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලු බදු, තීරුබදු සහ අය කිරීම්වලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 6. (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ හා සේවා ආනයන මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලු බදු, තීරුබදු සහ අය කිරීම්වලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 7. 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු පනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ ආනයන මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලු බදු, තීරුබදු සහ අය කිරීම්වලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 8. 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ ආනයන මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලු බදු, තීරුබදු සහ අය කිරීම්වලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 9. 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම් සහ සූදු බදු පනත | මේ පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරිගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. |
| 10. 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත | මේ පනතේ සියලු විධිවිධානවලින් නිදහස් වන්නේ ය. |
| 11. (267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥා පනත | මේ පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරිගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. |
| 12. 2017 අංක 12 දරන විදේශ විනිමය පනත | 2022 ජූනි මස 03 වන දින අංක 2282/59 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2022 අංක 01 දරන විදේශ විනිමය (කොළඹ වරාය නගරය තුළ ආයෝජන) නියෝග හැර, මේ පනතේ සියලු විධිවිධානවලින් නිදහස් වන්නේ ය. |
| 13. 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත | මේ පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරිගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. |

**IV** වන උපලේඛනය

**ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම්වල හෝ දිරිගැන්වීම්වල වලංගු කාලය**

| *පනතේ II වන උපලේඛනයේ ලැයිස්තුගත පනත්* | *ආරම්භ වන දිනය* | *අවසන් වන දිනය* |
|---|---|---|
| 1. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත | 2024 ජූලි 15 | 2049 ජූලි 14 |
| 2. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | 2024 ජූලි 15 | 2049 ජූලි 14 |
| 3. 2002 අංක 11 දරන මුදල් පනත | 2024 ජූලි 15 | 2049 ජූලි 14 |
| 4. 2005 අංක 5 දරන මුදල් පනත | 2024 ජූලි 15 | 2049 ජූලි 14 |
| 5. 1989 අංක 13 දරන සුරාබදු (විශේෂ විධිවිධාන) පනත | 2024 ජූලි 15 | 2049 ජූලි 14 |
| 6. (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත | 2024 ජූලි 15 | 2049 ජූලි 14 |
| 7. 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු පනත | 2024 ජූලි 15 | 2049 ජූලි 14 |
| 8. 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත | 2024 ජූලි 15 | 2049 ජූලි 14 |
| 9. 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම් සහ සූදු බදු පනත | අදාළ නොවේ | අදාළ නොවේ |
| 10. 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත | 2024 ජූලි 15 | 2049 ජූලි 14 |
| 11. (267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥාපනත | අදාළ නොවේ | අදාළ නොවේ |
| 12. 2017 අංක 12 දරන විදේශ විනිමය පනත | 2024 ජූලි 15 | 2049 ජූලි 14 |
| 13. 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත | අදාළ නොවේ | අදාළ නොවේ |

EOG - 07 - 0204

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.